සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

## පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

**I පත්‍රය**

**නැණ ලොවට පා නගන හපනුන්ට මඟ කියන**
**"අදිති"**

පැය 01 යි

විභාග අංකය ...............................

# පෙරහුරු ප්‍රශ්න පත්‍රය - අංක 03

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

✦ **අංක 1 සහ අංක 2 ප්‍රශ්නවල දී ඇති රූප අතරින් දෙකක් සමානව ඇඳ ඇත. වෙනස්ව ඇඳ ඇති රූපය තෝරන්න.**

01.



(1)



(2)



(3)

02.



(1)



(2)



(3)

✦ **මුලින් දී ඇති රූපයට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

03.



(1) දැනුම, සතුට, තොරතුරු

(2) මුදල්, ක්‍රීඩා, නාට්‍ය

(3) ක්‍රීඩා, දුක, තොරතුරු

04.



(1) පැදීම, ඉන්ධන, සතුට

(2) ගමන්, ක්‍රීඩා, තොරතුරු

(3) ගමන්, ව්‍යායාම, පැදීම

✦ **රටාව තේරුම් ගෙන හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව තෝරා යටින් ඉරක් අඳින්න.**

05.










(1) 18 (2) 14 (3) 20

06.










(1) 30 (2) 26 (3) 8

07.




| 2 × 5 \| 25 | 2 × 6 \| 25 | 2 × 4 \| 25 |
|---|---|---|
| (1) | (2) | (3) |

08. ත්‍රිකෝණයක් නිර්මාණය කර ගැනීම සඳහා වෙනස් නොකළ යුතු ඉලක්කම් දෙකක් වන්නේ,




(1) 9 සහ 5 (2) 8 සහ 10 (3) 9 සහ 6

09. මගේ මව වෛද්‍යවරියකි. ඇයගේ මව ගුරුවරියක් වන අතර සහෝදරිය හෙදියකි. ඒ අනුව මගේ මිත්තණිය නිරත වන රැකියාව වන්නේ,

(1) වෛද්‍යවරියකි (2) ගුරුවරියකි (3) හෙදියකි

10. ''චතිස්ක'' බෙහෙත් ගැනීමට රෝහලට ගිය විට ඔහු පෝලිමේ සිටියේ 10 වෙනියාට ය. ඔහුට තව දෙදෙනෙකු පසු කර ඉදිරියට යාමට හැකි නම් ඔහු පෝලිමේ හරි මැදට යා ගත හැකි වේ. එසේ නම්, චතිස්ක මුලින් සිටි ස්ථානයට පිටුපසින් මිනිසුන් කී දෙනෙක් සිටියේ ද?

(1) 5 (2) 3 (3) 2

11. පහත දැක්වෙන පතොරම භාවිතයෙන් සාදන ලද ඝනකයේ එක්තරා පිහිටීමක දී ඉදිරි පෙනුම [5] මුහුණත ද පැති පෙනුම ලෙස [4] මුහුණත ද පිහිටයි. මේ අවස්ථාවේ දී ඝනකයේ සැලැස්ම ලෙස පිහිටන මුහුණත කුමක් ද?




| [3] | [5] | [2] |
|---|---|---|
| (1) | (2) | (3) |

12. ජල ටැංකියකට ජලය පිරවීමේ දී එහි තිබෙන ජල ප්‍රමාණය සෑම මිනිත්තු දෙකක දී ම දෙගුණයක් බවට පත් වේ. මිනිත්තු 12ක දී ටැංකියේ අඩක් ජලයෙන් පිරුණේ නම් ටැංකිය සම්පූර්ණයෙන් ම ජලයෙන් පිරීමට ගත වන කාලය වන්නේ,

(1) මිනිත්තු 24 (2) මිනිත්තු 14 (3) මිනිත්තු 10

13. මුතුලැල් පැළ තවානට ගොස් මිල දී ගත් පැළ පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| පලතුරු පැළ 06 | පලතුරු නොවන පැළ 05 |
| කෙසෙල් පැළ 02 | තේක්ක පැළ 06 |

ඔහු මිලදී ගත් මුළු පැළ ගණන වන්නේ,

(1) 14 කි. (2) 11 කි. (3) 13 කි.

14. සමමිතික රේඛා වැඩි ම ප්‍රමාණයක් දැක්වෙන හැඩතලය නිර්මාණය කර ගැනීමට යොදාගත හැකි ඉරටු මිටි ඇතුළත් පිළිතුර වන්නේ,

(1) 

(2) 

(3) 

15. මුහුණ බලන කණ්ණාඩියකින් බැලූ විට එලෙසින් ම පෙනෙන ඉංග්‍රීසි අක්ෂර වන්නේ,

(1) A,T (2) B,H (3) C,O

16. පහත දැක්වෙන කඩදාසි පටිය සමමිතික අක්ෂය දිගේ දෙකට නවා, නැවතත් හරි මැදින් දෙකට නවා නැවතත් හරි මැදින් කතුරකින් කැපූ විට ලැබෙන කඩදාසි කැබලි ගණන වන්නේ,



(1) 6කි (2) 5කි (3) 4කි

✦ **ප්‍රශ්න අංක 17 සහ 18 සඳහා රටාව තේරුම් ගෙන හිස්තැනට ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

17.




(1) 24 (2) 36 (3) 48

18.

| | | |
|---|---|---|
| 3 | 2 | 85 |
| 7 | 1 | |

| | | |
|---|---|---|
| 5 | 1 | 76 |
| 2 | 5 | |

| | | |
|---|---|---|
| 1 | 0 | |
| 3 | 4 | |

(1) 61 (2) 71 (3) 81

19. 

මෙම රූපයේ ත්‍රිකෝණ ගණන

(1) 9කි (2) 5කි (3) 10කි

20. දෙනුවන් අටපට්ටමක් සෑදීමට සකස් කළ සමචතුරස්‍රාකාර පට්ටම් 6න් එක් සමචතුරස්‍රාකාර පට්ටමක පැත්තක දිග වූයේ 30cmකි. එම පට්ටම් සියල්ල එකට ගෑවෙන සේ එක පෙළට තැබූ විට එහි වටේ දිග කොපමණ ද?

(1) 410cm (2) 420cm (3) 460cm

21. වෘත්තාකාර ධාවන මන්තීරුවක තරගකරුවන් පස් දෙනෙක් එකම තැනකින් තරගය අරඹති. X,Y දෙදෙනා එකම දිශාවකටත්, ABC තිදෙනා XY ට ප්‍රතිවිරුද්ධ දිශාවටත්, දුවති. ධාවන පථයෙන් $\frac{2}{3}$ ක් ගිය විට X ට B මුණ ගැසුණි. ධාවන පථයෙන් බාගයක් ගිය විට Y ට C මුණ ගැසේ. X ට C හමුවන්නේ ධාවන පථයෙන් $\frac{1}{3}$ක් ගිය විට ය. වැඩි ම වේගයෙන් දුවන ක්‍රීඩකයා වන්නේ,

(1) X ය (2) B ය (3) C ය

22. 

මෙම රූපයේ අඳුරු කළ කොටසේ වටේ දිග 8 cm ක් නම් මුළු රූපයේ වටේ දිග වන්නේ,

(1) 40 cm (2) 24 cm (3) 36 cm

✦ **පහත සටහන දෙස බලා 23 සහ 24 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**


= 60


= 35


= 75

23.  අගය කීය ද?

(1) 5කි (2) 15කි (3) 10කි

24.  අගය කීය ද?

(1) 75කි (2) 90කි (3) 60කි

25. රටාව අනුව **?** ලකුණට ගැළපෙන පිළිතුර වන්නේ,




(1) 

(2) 

(3) 

26. වෙළෙඳ සැලක සැමන් ටින් ගොඩ ගසා ඇත්තේ ත්‍රිකෝණාකාර ලෙසය. එහි යටම පෙළේ ටින් 5ක් ඇත්නම් එහි ඇති මුළු ටින් ගණන සොයන්න.

(1) 13 (2) 15 (3) 16

27. 2023 වර්ෂයේ ජනවාරි 01 වන දා සඳුදා දිනයක් නම් එම වසරේ දෙසැම්බර් 31 වන දින කුමන දවසක් ද?

(1) අඟහරුවාදා (2) බදාදා (3) සඳුදා

28. පහත සඳහන් දම්වැල කැබලි 5කට වෙන්කළ පසු එම කැබලිවල තිබිය හැකි උපරිම පුරුක් ගණන සහිත පිළිතුර වන්නේ,



(1) 4 කි. (2) 5 කි. (3) 16 කි.

29. ගොයම් කපා වී ඇට වෙන් කරගත් පසු ගොයමේ ඉතිරි වන කොටස වන්නේ,
(1) ඉපනැල්ල (2) කාටුව (3) පිදුරු

30. පහත ප්‍රකාශ අතරින් සෑම විට ම සත්‍ය වන ප්‍රකාශය වන්නේ,
(1) වැස්ස නිසා ගඟ උතුරා යයි.
(2) ඉර නැගෙනහිරින් පායා බස්නාහිරින් බැස යයි.
(3) සුළං හමන විට ගස් කඩා වැටෙයි.

31. පහත ප්‍රකාශ අතරින් සෑම විට ම සත්‍ය නොවන ප්‍රකාශය වන්නේ,
(1) කරවිල තිත්ත රසය වීම
(2) මුහුදු ජලය ලුණු රස වීම
(3) උදයට පිපනෙ මල් සවසට පරවීම

32. දින පහම පාසල් පැවැත් වූ සතියක කමල්ට එක ළඟ දින 3ක් පාසල් ඒමට නොහැකි විය. ඔහුට නිසැක ලෙස ම පාසල් යාමට නොහැකි වූ දවස වන්නේ,
(1) බදාදා (2) සිකුරාදා (3) අඟහරුවාදා

33. අනුරුද්ධගේ සහ නදීශා යන දෙදෙනාගේ දියණියන් වන්නේ විහාරා හා සඳුෂි ය. විහාරා බණ්ඩාරට සීයා ලෙස ආමන්ත්‍රණය කරයි නම් සඳුෂි, බණ්ඩාරගේ කවුරුන් ද?
(1) දියණිය යි. (2) මිණිබිරිය යි. (3) යේලිය

✦ **34 සහ 35 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත සඳහන් මාර්ග සැලැස්ම සැලකිල්ලට ගන්න.**



34. අවිශ්ක නිවසේ සිට පාසලට යාමේ දී ඔහු ගමන් කරන අනු දිශා වන්නේ,

(1) උතුරු දිශාව (2) ඊසාන දිශාව (3) දකුණු දිශාව

35. ඔහු නැවත පාසලේ සිට නිවසට යාමේ දී දෙවන වංගුවෙන් හැරී ගමන් කරන්නේ කුමන දිශාවට ද?

(1) දකුණු දිශාවට (2) බස්නාහිර දිශාවට (3) උතුරු දිශාවට

36. පෙට්ටියක පෑන් අතරින් 4ක් හැර ඉතිරි ඒවා නිල් පාට ය. 4ක් හැර ඉතිරි ඒවා රතු පාටය, 4ක් හැර ඉතිරි ඒවා කළු පාට ය. මල්ලේ ඇති මුළු පෑන් ගණන සොයන්න.

(1) 6 කි. (2) 5 කි. (3) 10 කි.

37. බසයට සුක්කානම නම් ඔරුවට ...................

(1) හබල (2) කොල්ලෑව (3) දියාලුව

38. මුලින් දක්වා ඇත්තේ සැමන් ටින් එකක තීන්ත තවරා ඇති ආකාරයයි. එම සැමන් ටින් එක කඩදාසියක් මත රෝල් කරන ආකාරය ඊතලය මගින් පෙන්වා ඇත. එසේ රෝල්කළ පසු කඩදාසියේ තීන්ත තැවරී ආකාරය නිවැරදිව දැක්වෙන රූපය වන්නේ,



(1) (2) (3)

39. විදූෂ වැඩ ඇරී නිවසට එන විට ඔහුගේ සෙවණැල්ල ඔහු ඉදිරියෙන් වැටී තිබුණි. එවිට තාරක හා විදූෂ මුහුණට මුහුණ මුණ ගැසුණේ නම් තාරක ගමන් කළේ කුමන දිශාවට මුහුණලා ද?

(1) බස්නාහිර දිශාව (2) නැගෙනහිර දිශාව (3) උතුරු දිශාව

40. සුපුන් කෙටිකතා පොතක පිටු අංක 1 සිට 10 තෙක් කියවා නිම කළේය. ඔහු කියවූ පොතේ පිටු අංක වල එකතුව වන්නේ,

(1) 11 (2) 55 (3) 50